රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 18/98

මගේ අංකය :-1/සිඊ/98-9
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998 මැයි 29

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් සභා යටතේ වන රාජ්‍ය ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා
රාජ්‍ය සමාගම් ප්‍රධානීන් වෙත.

**<u>රාජ්‍ය හා අර්ධ රාජය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 1998</u>**

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ මීලඟ සංගණනය 1998 ජූලි මස 1 වන දින පැවැත්වීමට ජලලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් විධිවිධාන යොදනු ලැබ ඇත. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණන 1968,1972 සහ 1976 වර්ෂවලදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සහාය ඇතිව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ඇත. 1980,1990 සහ 1994 වර්ෂවලදී පැවැත්වූ සංගණන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. 1998 වර්ෂයේදී පැවැත්වීමට බලාපොරොත්තු වන්නේ මෙම සංගණන මාලාවේ අට වැන්නයි.

02. මෙම සංගණනයට මධ්‍යම රජය යටතේ පවත්නා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු , ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා සහ රාජ්‍ය - පෞද්ගලික සමාගම්ද, පළාත් සභා යටතේ පවත්වා රාජ්‍ය ආයතනයන්හි ද සේවයේ නියුක්ත , ස්ථිර, අනියම්, තාවකාලික සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සෑම තරාතිරමකට අයත් සේවා නියුක්තිකයන් ඇතුළත් විය යුතු වේ. අදාල ආකෘති පත්‍ර සේවා නියුක්තිකයන් විසින් පෞද්ගලිකවම සම්පූර්ණ කොට තොරතුරු සැපයිය යුතු වේ.

03. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ආකෘති පත්‍රයේ පිටපත් අදාල අමාත්‍යාංශයේ හෝ පළාත් සභාවේ සම්බන්ධීකරණ නිලධාරී මගින් සේවා නියුක්තිකයින් වෙත සපයනු ඇත. මේ සම්බන්ධයෙන්,

* ආයතනයේ සියළුම සේවා නියුක්තිකයින් වෙත ආකෘති පත්‍ර බෙදදීම.
* සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර ඔවුන්ගෙන් ආපසු ලබා ගැනීම.
* සේවා නියුක්තිකයින් සියළුම දෙනා විසින් සම්පූර්ණයෙන් සහ නිවැරදිව එම ආකෘති පත්‍ර පුරවා තිබේදැයි පරීක්ෂා කොට බැලීම.
* සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර 1998 ජූලි මස 15 වන දින වන විට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ආපසු එවීම යන කරුණු සිදු කල යුතුව ඇත.

04. මෙම සංගණනයෙන් ලබා ගන්නා දත්ත හා තොරතුරු ඉදිරි සැලසුම් සකස් කිරීමෙහි ලා රජයටත්, වෙනත් ආයතනවලටත් ඉතා ප්‍රයෝජනවත් වේ. එහෙයින් ඉහත කී කාර්යයන් නිසි අයුරු ඉටු කර ගැනීමට ඔබ ආයතනයේ සියළුම සේවා නියුක්තිකයින්ගේ තොරතුරු සම්පූර්ණව ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන යෙදීමෙන්, සංගණනය සාර්ථක කර ගැනීමට සහයෝගය දක්වන ලෙස මම ඔබගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි.

අ.කලේ/පී.ජ්.සේනාරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

පිටපත් I. අධ්‍යක්ෂ ජනරාල් , ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
II. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය